**මහනුවර ඇසළ පෙරහැර භාරය - 2018**

-----------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මහනුවර ඇසළ පෙරහැර භාරයේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඇසළ පෙරහැර භාරයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ඇසළ පෙරහැර භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස භාරයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, භාරය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 70 සහ 88 ඡේද අනුව ජංගම වත්කම් ද්‍රවශීලතා අනුපිළිවෙලට ශේෂ පත්‍රය මගින් අනාවරණය කර නොතිබුණි. | 2019 මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී මෙම කරුණ පිළිබඳව අවධානය යොමු කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සකස් කිරිමට කටයුතු කරන බව | ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 හි ,<br>• 9 වන ඡේදය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.2,951,495 ක ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.<br>• 27 වන ඡේදයේ (අ) හා (ආ) අනුව මුදල් ප්‍රවාහය ඍජු ක්‍රමය හෝ වක්‍ර ක්‍රමය යන ක්‍රම දෙකින් එකක් උපයෝගී කරගනිමින් සකස් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහය සකස් කිරීම සඳහා පැහැදිලි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | 2019 වර්ෂයේ ගිණුම් සැකසීමේදී මෙම වර්ෂයේ පෙන්වාදී ඇති කරුණුද සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමට කටයුතු කරන බව. | -එම- |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පතුවකට අදාළව සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.10,335 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | බදු අය කිරීමට පෙර අගයට අදාළ බදු මුදල එකතු කිරීම හේතුවෙන් උක්ත වෙනස නිරීක්ෂණය වී ඇත. 2019 වර්ෂයේදී එය ගැලපීම් කර නිවැරදි කිරීමට කටයුතු කරන බව වාර්තා කරමි. | රඳවා ගැනීම් බදු මුදල අඩු කිරීමට පෙර අගය පොළී ලෙස ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) | මහා භාරකාර දෙපාර්තමේන්තුව විසින් පෙරහැර භාරය වෙනුවෙන් 2018 ජුනි 25 දින ආයෝජනය කර ඇති රු.මිලියන 20 ක ස්ථාවර තැන්පතුව සඳහා ලැබිය යුතු පොළී ආදායම රු.1,216,849 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු රු.1,000,000 ක් ලෙස රු.216,849 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉකුත් වර්ෂවල මහා භාරකාර දෙපාර්තමේන්තුවෙන් ගෙවා ඇති පොළී මුදල මිලියනයක් බැවින් 2018 වර්ෂය සඳහාද එම පොළී මුදල අපේක්ෂා කර ඇති බව වාර්තා කරමි. | පොළී ප්‍රතිශතය අනුව පොලිය ගණන් කළ යුතු වීම. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1980 අංක 34 දරන මහනුවර ඇසළ පෙරහැර භාර පනත** | | | |
| | 8(1) වගන්තිය | ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකු ඇතුළුව ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිලමේ, සතර මහා දේවාලවල බස්නායක නිලමේවරුන් හා මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයාගෙන් සමන්විත උපදේශක කමිටුවක් පත්කළ යුතු වුවත්, එම කමිටුව පත්කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුද ඊට ඇතුළත් විය යුතු වුවද මේවන තෙක් ඒ සඳහා තිදෙනෙකු පත්කර නොමැත. එහෙත් කමිටුවක් ලෙස නම්කොට නොතිබුණද මෙම උපදේශක කමිටුවේ අනෙකුත් සාමාජිකයන් විසින් අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කරනු ලබන බව. | පනත ප්‍රකාරව උපදේශක කමිටුවක් පත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය<br>-------------------<br>4.1 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අනුමත කරන ලද අයවැය ලේඛනයකින් තොරව අදාළ මුදල් වර්ෂයේදි කිසිදු වියදමක් නොදැරිය යුතු බවට දන්වා තිබුණද ඒ අනුව අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි. | කිසිම අමාත්‍යාංශයකින් හෝ දෙපාර්තමේන්තුවකින් ඇසළ පෙරහැර භාරය වෙත වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොවන බැවින් වාර්ෂික ඇස්තමේන්තුව, භාරය විසින්ම අනුමත කිරීමට කටයුතු කර ඇති බව. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඇසළ පෙරහැර භාරයද වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අයවැය අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**
------------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**
--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 263,607 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 741,890 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 478,283 ක පිරිහීමක් නිරීක්ෂණය වූ අතර, මෙම පිරිහීමට ආසන ආදායම් අඩුවීම හා නිර්වින්ධන කාර්යය මණ්ඩල වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**
------------------------------

**3.1 හඳුනාගත් පාඩු**
------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 ජනවාරි 01 දින සිට 2018 ජුනි 25 දින දක්වා රු.20,000,000 ක් වූ මුදල මහාභාරකාර දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුමේ රඳවා තබාගැනීම හේතුවෙන් පෙරහැර භාරයට මූල්‍යමය පාඩුවක් සිදුව තිබුණි. | 2019 හා ඉදිරි වර්ෂ සඳහා ලංකා බැංකුවේ පොළී අනුපාතය මත පොළී මුදල් ලබාදෙන ලෙස මහාභාරකාර දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමට කටයුතු කරන බව වාර්තා කරමි. | මහාභාරකාර දෙපාර්තමේන්තුව ක්ෂණිකව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මාස 11 ක් තුළදී රු. මිලියන 02 ට වඩා වැඩි අවසන් ශේෂයක් ඉතිරිකිරීමේ ගිණුමේ පැවතුණද, මෙම මුදල් ඉහළ පොළී ආදායමක් ලැබෙන ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන යනු ලැබුවේ මුදල් ලබාගැනීමේ පහසුව සඳහා වන බව වාර්තා කරන අතර මෙම වසරේ එම මුදලින් කොටසක් ස්ථාවර තැන්පතුවකට මාරු කිරීමට භාරය විසින් අදහස් කලද පැවති සමාජීය තත්වයන් මත මෙය ක්‍රියාත්මක කළ නොහැකි විය. | ස්ථාවර තැන්පතු වල මුදල් ආයෝජනය කිරිමට කටයුතු කළ යුතු වීම. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නර්තන ශිල්පීන් වෙනුවෙන් ලබා දිය යුතු දීමනා ඔවුන් කරනු ලබන සේවයට ගෞරවයක් හෝ උපහාරයක් ලෙස සලකා ලබාදීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. එසේ හෙයින් පෙර වර්ෂයේ නර්තන ශිල්පීයෙකුට ගෙවිය යුතු රු.8,000 ක මුදල නොගෙවා සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | අදාල ශිල්පීයාව දැනුවත් කරන ලෙස අදාළ ආයතනය දැනුවත් කල බව. | සෑම අවස්ථාවකදීම නර්තන ශිල්පීන් දිරිමත් කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. |
| (ආ) | බලපත්‍ර ලබා නොගෙනම ආසන පනවා තිබීම, බලපත්‍ර ලබාගත් පුද්ගලයින් විසින් බලපත්‍ර ලබා නොගත් දිනයන් තුළ ආසන පනවා තිබීම හා බලපත්‍රයේ සඳහන් ආසන ප්‍රමාණය ඉක්මවා ආසන පැනවීම හේතුවෙන් එකතුව රු.18,400 ක බලපත්‍ර ආදායමක් හා ආසන සංඛ්‍යාව මත අයකරන දඩමුදලේ එකතුව රු.207,250 ක ආදායමක් අහිමි තිබුණි. | බලපත්‍ර ලබා නොගෙන ආසන පනවා තිබූ ස්ථානවලින් අදාල දඩ මුදල් අය කිරීමට භාරය විසින් කටයුතු කල අතර, ආසන පනවන්නන්ගේ නියෝජිතයින් විසින් හා ඇතැම් බලපත්‍රලාභීන් විසින් ඔවුන්ගේ ස්ථානවල අනෙකුත් පුද්ගලයින්ටද ආසන පැනවීමට අවස්ථාව ලබාදී තිබුණි. මෙම තත්ත්වය 2019 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කළ බව. | බලපත්‍ර ලබාදීම සම්බන්දව නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු වීම. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ආසන ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.2,432,050 කින් එනම් සියයට 33 කින් අඩුවී ඇති අතර, ආසන මත පනවනු ලබන ගාස්තු වැඩිකර ගැනීමත්, නිවැරදිව අයකර ගැනීමත් කෙරෙහි පරිපාලනයේ අවධානය යොමු වී නොතිබුණි. | පසුගිය වර්ෂයට සාපේක්ෂව ආසන ආදායම අඩුවීම මූල්‍ය අතිරික්තය පහළ අගයක් ගැනීමට හේතුවී ඇත. | ප්‍රධාන ආදායම් මාර්ගය ඉහළ නංවා ගැනීමට ක්‍රියාකළ යුතු වීම. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී නැටුම් ශිල්පී ත්‍යාග, නිර්වින්දන කාර්ය මණ්ඩල වියදම, විනිශ්චය මණ්ඩලය සඳහා දීමනා හා කුසලාන වියදම සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා රු.616,000 ක් වියදම් දරා තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා අනුමැතීන් ලබා ගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේදී මේ සඳහා අනුමැතිය ලබාගෙන ඇති බව වාර්තා කරමි. | ඇස්තමේන්තු සංශෝධනයක් සිදු කරන්නේ නම් එය වර්ෂය තුළදී සිදුකළ යුතු වීම. |